# මූලික පිරිවෙන් අවසාන විභාගය

# ඇගයීම් වාර්තාව

# 04-සංස්කෘත

# 2019

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව මූලික පිරිවෙන් විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

අ.පො.ස (සා.පෙළ) මට්ටමේ පවතින මූලික පිරිවෙන් අවසාන විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක අධ්‍යාපන ලැබීමට හැකි මඟක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවේණාචාර්යවරුන් ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පළමු වරට මූලික පිරිවෙන් අවසාන විභාගය -2019 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තාව ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරුභවතුන්ට, පරිවේණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

මූලික පිරිවෙන් අවසාන විභාගයට අදාළ සංස්කෘත විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පිරිවෙන් අපේක්ෂකයින් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය, විෂයය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු, I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය හා එම ප්‍රශ්නවල හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. පිරිවෙන් විභාගයේ සංස්කෘත විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවල අපේක්ෂකයින් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන දත්ත, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය ( Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අපේක්ෂකයින්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයින් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සංස්කරණ හා සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරින්ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

2022.11.18

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල,

එල්. එම්. ඩී. ධර්මසේන
විභාග කොමසාරිස් ජනරාල්

## පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක වන මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගගේ ජාතික අධ්‍යාපනයේ කේන්ද්‍රය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යාප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබා දීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම යන මූලික දෑ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම සිරි ඝනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවි යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම්  යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සම්ප්‍රදායික හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවි ව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිටා පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට 1981 පවත්වන ලදී. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 135 ක් විභාගය අසමත් විය.

වර්තමානයේ දී සාමාන්‍ය පෙළ විභාගය හා සම මට්ටමේ ලා සලකනු ලබන මෙම විභාගයේ දී අපේක්ෂයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පිත විෂයයන් 02ක්වත් තෝරා ගත යුතු ය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂයයන් ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතුයි. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌණ සාමාර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌණ සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතුයි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළමුවරට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරින්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා තනන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතුවේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය : | | එල්. එම්. ඩී. ධර්මසේන<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා අධීක්ෂණය | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| සම්බන්ධීකරණය හා සංවිධානය | : | ඩී. ඩී. වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග) |
| විෂය සම්බන්ධීකරණය | : | ඩබ්. සී. ප්‍රියදර්ශනී<br>සහකාර විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| සංස්කරණය | : | පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>ඉසුරුපාය , බත්තරමුල්ල |
| ලේඛක මණ්ඩලය | : | පූජ්‍ය උඩවෙල රේවත හිමි<br>ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය<br>සංස්කෘත හා පෙරදිග අධ්‍යයන අංශය,<br>කැළණිය විශ්ව විද්‍යාලය<br><br>පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br>ඉසුරුපාය , බත්තරමුල්ල |
| | : | පූජ්‍ය හසලක සෝමරතන හිමි<br>උපගුරු<br>කො/මහාබෝධි මහා විද්‍යාලය<br>කොළඹ 10<br><br>පූජ්‍ය රූපහ ඥාණරතන හිමි<br>නියෝජ්‍ය පරිවේණාධිපති<br>සාසනවර්ධන පිරිවෙන<br>මීරිගම<br><br>එච්. එම්. එම්. ප්‍රියදර්ශන<br>පරිවෙණාචාර්ය<br>මො/සිරි සුමන මහා පිරිවෙන<br>විහාරමුල්ල, මොනරාගල |
| පරිගණක පිටපත සැකසුම | : | ජේ. කේ. එච්. නවෝදනී ජයනෙත්ති<br>(දත්ත සටහන් සහකාර) |
| පිටකවරය නිර්මාණය | : | ආර්. එම්. නිලුපුල් ශෙහාන් යසරත්න<br>(දත්ත සටහන් සහකාර) |

## පටුන

පිටු අංකය

**I කොටස**

**1. විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු**

**1.1** සංස්කෘත විෂය අධ්‍යයනයේ අරමුණු 1

**1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු**

1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 2

1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2

1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය 4

**1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය**

1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5

1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6

1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6

1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7

**II කොටස**

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

**2.1 ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 8

2.1.2 I ප්‍රශ්න පත්‍රය ( ප්‍රශ්න 1 සිට 40 දක්වා) 9

2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 13

2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ -තේමා අනුව 14

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශතයක් ලෙස 15

2.1.6 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ නිගමන හා යෝජනා 16

**2.2. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 18

2 2.2 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු
ලකුණු දීමේ පටිපාටිය පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 19

**III කොටස**

**3 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා**

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 36

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා පොදු යෝජනා 37

# I කොටස

## 1 විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 සංස්කෘත විෂය අධ්‍යයනයේ අරමුණු

01. සිංහල හා සංස්කෘත වර්ණමාලාව පිළිබඳව තුලනාත්මක අධ්‍යයනයකට පෙළඹවීමක් ලැබීම.
02. සිංහල භාෂාව නිවැරදි භාවිත කිරීමට මූලාධාර වීම.
03. ආයුර්වේදය, ජ්‍යෝතිර්විද්‍යාව, නක්ෂත්‍රශාස්ත්‍රය වැනි විවිධ ශාස්ත්‍ර, කලා ශිල්ප හා දර්ශනවාද ඉගෙනීමේ දී ජීව භාෂාවක් වශයෙන් දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනයට ශක්තිමත් පදනමක් සැපයීම.
04. ඉන්දියානු භාෂා අධ්‍යයනයට අත්වැලක් සැපයීම.
05. පුරාණ ඥාන ගවේෂණය සඳහා උපකාරී වීම.
06. වාග්විද්‍යාත්මක භාෂා ගවේෂණයට හා පාරිභාෂික ශබ්දමාලා සම්පාදනයට මූලාධාර වීම.
07. සාහිත්‍ය රසාස්වාදයට රුකුලක් වීම.
08. හරධර්ම චරිතායනයට සහය වීම.
09. තොරතුරු තාක්ෂණය සඳහා විධිමත් භාෂා මාධ්‍යයක් ගොඩනැගීමට මූලාධාර වීම.
10. විශ්වීය කේත (Universal Code ) ක්‍රමයකට අවශ්‍ය විද්‍යාත්මක භාෂා අධ්‍යයනය සඳහා රුකුලක් වීම.
11. සංස්කෘත භාෂාවෙන් ලියවී ඇති හින්දු ස්තෝත්‍ර හා බෞද්ධ ශ්ලෝකය මගින් ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සමගියට අවශ්‍ය දායකත්වය ලබාදීම.
12. ලෞකික සංස්කෘත සාහිත්‍යය හා බෞද්ධ සංස්කෘත සාහිත්‍යය අධ්‍යයනය කිරීමෙන් උභයාර්ථ සංසිද්ධිය ඇති කරලීම සඳහා මනා රුකුලක් වීම.

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 2138 | 27 | 2165 |
| ඉංග්‍රීසි | 12 | 0 | 12 |
| **එකතුව** | **2150** | **27** | **2177** |

**වගුව 1**

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පිරිවෙන් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 143 | 6.65 | 2 | 7.41 | 145 | 6.66 |
| B | 171 | 7.95 | 1 | 3.70 | 172 | 7.91 |
| C | 624 | 29.02 | 5 | 18.52 | 629 | 28.89 |
| S | 922 | 42.89 | 10 | 37.04 | 932 | 42.81 |
| W | 290 | 13.49 | 9 | 33.33 | 299 | 13.73 |
| **එකතුව** | **2150** | **100.00** | **27** | **100.00** | **2177** | **100.00** |

**වගුව 2**

## 1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 148 | 15 | 10.14 | 8 | 5.41 | 53 | 35.81 | 57 | 38.51 | 133 | 89.86 | 15 | 10.14 |
| ගම්පහ | 193 | 31 | 16.06 | 21 | 10.88 | 34 | 17.62 | 82 | 42.49 | 168 | 87.05 | 25 | 12.95 |
| කළුතර | 123 | 8 | 6.5 | 11 | 8.94 | 38 | 30.89 | 55 | 44.72 | 112 | 91.06 | 11 | 8.94 |
| මහනුවර | 250 | 37 | 14.8 | 28 | 11.2 | 84 | 33.6 | 83 | 33.2 | 232 | 92.8 | 18 | 7.20 |
| මාතලේ | 71 | 3 | 4.23 | 5 | 7.04 | 18 | 25.35 | 37 | 52.11 | 63 | 88.73 | 8 | 11.27 |
| නුවරඑළිය | 31 | 1 | 3.23 | 5 | 16.13 | 18 | 58.06 | 7 | 22.58 | 31 | 100 | 0 | 0 |
| ගාල්ල | 176 | 7 | 3.98 | 11 | 6.25 | 43 | 24.43 | 80 | 45.45 | 141 | 80.11 | 35 | 19.89 |
| මාතර | 159 | 2 | 1.26 | 19 | 11.95 | 50 | 31.45 | 69 | 43.4 | 140 | 88.05 | 19 | 11.95 |
| හම්බන්තොට | 97 | 0 | 0 | 4 | 4.12 | 37 | 38.14 | 40 | 41.24 | 81 | 83.51 | 16 | 16.49 |
| වවුනියාව | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 100 | 1 | 100 | 0 | 0 |
| මඩකළපුව | 2 | 0 | 0 | 1 | 50 | 1 | 50 | 0 | 0 | 2 | 100 | 0 | 0 |
| අම්පාර | 57 | 6 | 10.53 | 7 | 12.28 | 21 | 36.84 | 20 | 35.09 | 54 | 94.74 | 3 | 5.26 |
| ත්‍රිකුණාමලය | 16 | 0 | 0 | 0 | 0 | 2 | 12.5 | 11 | 68.75 | 13 | 81.25 | 3 | 18.75 |
| කුරුණෑගල | 214 | 11 | 5.14 | 12 | 5.61 | 46 | 21.5 | 102 | 47.66 | 171 | 79.91 | 43 | 20.09 |
| පුත්තලම | 45 | 2 | 4.44 | 0 | 0 | 7 | 15.56 | 30 | 66.67 | 39 | 86.67 | 6 | 13.33 |
| අනුරාධපුර | 131 | 7 | 5.34 | 4 | 3.05 | 33 | 25.19 | 56 | 42.75 | 100 | 76.34 | 31 | 23.66 |
| පොළොන්නරුව | 39 | 1 | 2.56 | 3 | 7.69 | 4 | 10.26 | 26 | 66.67 | 34 | 87.18 | 5 | 12.82 |
| බදුල්ල | 116 | 2 | 1.72 | 8 | 6.9 | 32 | 27.59 | 57 | 49.14 | 99 | 85.34 | 17 | 14.66 |
| මොණරාගල | 66 | 2 | 3.03 | 5 | 7.58 | 18 | 27.27 | 30 | 45.45 | 55 | 83.33 | 11 | 16.67 |
| රත්නපුර | 125 | 4 | 3.2 | 15 | 12 | 45 | 36 | 46 | 36.8 | 110 | 88.00 | 15 | 12.00 |
| කෑගල්ල | 117 | 6 | 5.13 | 5 | 4.27 | 45 | 38.46 | 43 | 36.75 | 99 | 84.62 | 18 | 15.38 |
| සමස්ත ප්‍රතිඵලය | 2177 | 145 | 6.66 | 172 | 7.9 | 629 | 28.89 | 932 | 42.81 | 1878 | 86.27 | 299 | 13.73 |

වගුව 3

## 1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 12 | 0.55 | 2177 | 100.00 |
| 81 - 90 | 69 | 3.17 | 2165 | 99.45 |
| 71 - 80 | 106 | 4.87 | 2096 | 96.28 |
| 61 - 70 | 252 | 11.58 | 1990 | 91.41 |
| 51 - 60 | 359 | 16.49 | 1738 | 79.83 |
| 41 - 50 | 466 | 21.41 | 1379 | 63.34 |
| **31 - 40** | **395** | **18.14** | **913** | **41.94** |
| 21 - 30 | 332 | 15.25 | 518 | 23.79 |
| 11-20 | 169 | 7.76 | 186 | 8.54 |
| 01 - 10 | 17 | 0.78 | 17 | 0.78 |
| 00 - 00 | 0 | 0'00 | 0 | 0.00 |


වගුව 4

ඉහත වගුව අධ්‍යයනයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදාහරණය ;- 31- 40 අතර පන්ති ප්‍රාන්තරය සලකා බලන විට,
මෙම විෂය සඳහා පෙනී සිටි 2177 අපේක්ෂකයන් අතුරෙන් 31- 40 අතර ලකුණු ලබාගත් සංඛ්‍යාව 395කි. එය ප්‍රතිශතයක් ලෙස 18.14% කි. ලකුණු 40ට අඩුවෙන් ලකුණු ලබා ඇති සංඛ්‍යාව 913ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 41.94% කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය


### 1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




(ප්‍රස්තාරය 01 (RD/16/5/MPF) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි).

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා; ඉහත ප්‍රස්තාරයට අනුව 3වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සපයා ඇත්තේ 73%ක් පමණ වන අතර 14 වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 25%ක් පමණ වේ. ඒ අනුව පහසුතාව අඩු එක් ප්‍රශ්නයක් වශයෙන් 14 වන ප්‍රශ්නය දැක්විය හැකි ය. මෙහි අපේක්ෂකයන් අඩුම සංඛ්‍යාවක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 24වන ප්‍රශ්නයටය. එහි පහසුතාව 24%කි.





ප්‍රස්තාරය 2 ( RD /16/2/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකසන ලදි )

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා: 1 හා 2 ප්‍රශ්න අනිවාර්යය වුවත් 2වන ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ 89%ක් පමණ පිරිසකි. සෙසු ප්‍රශ්නවලින් අපේක්ෂකයන් වැඩි පිරිසක් පිළිතුරු සපයා ඇත්තේ 4වන ප්‍රශ්නයට වන අතර එහි ප්‍රතිශතය 83%ක් පමණ වේ. 8වන ප්‍රශ්නය තෝරාගත් පිරිස 13%ක් පමණ වේ. එම ප්‍රශ්නය අඩුම අපේක්ෂකයන් පිරිසක් තෝරාගත් ප්‍රශ්නය වේ.


### 1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය




( RD /16/2/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකසන ලදි )

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා: මෙහි 1වන ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 12කි. අපේක්ෂකයන් 47%ක පිරිසක් 00% -25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 0-3 අතර ලබාගෙන ඇත. අපේක්ෂකයන් 35% ක පිරිසක් 26% -50% ප්‍රාන්තරයේ එනම් ලකුණු 4-6 අතර ලබාගෙන ඇත. අපේක්ෂකයන් 12%ක පිරිසක් 51% - 75% ප්‍රාන්තරයේ එනම් ලකුණු 7-9 අතර ලබාගෙන ඇත. අපේක්ෂකයන් 6%ක් පමණ 76%-100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 10-12 අතර ලබාගෙන ඇත.

### 1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4 (RD/16/4/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා-: 1වන ප්‍රශ්නයේ එක් එක් කොටස සඳහා සාර්ථකව පිළිතුරු සැපයූ ප්‍රතිශතය (i) කොටස සඳහා 57%ක් පමණ ද (ii) කොටස සඳහා 19 %ක් පමණ ද වේ. අංක 7 ප්‍රශ්නයේ (ii) (a) අනුකොටසෙහි පහසුතාව 96%කි. මෙම ප්‍රශ්න අතුරෙන් අඩුම පහසුතාව පෙන්වන්නේ 2 ප්‍රශ්නයේ (i) කොටසයි. එහි පහසුතාව 15%කි.

## II කොටස

## 02 ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

**කාලය : පැය 01 යි.**

වරණ 04 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 40කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

සැලකිය යුතුයි / **Note** :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
  Answer **all** questions. This paper carries **40** marks.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
  In each of the questions from **1** to **40**, pick one of the alternatives (1), (2), (3), (4) which is **correct or most appropriate.**
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
  **Mark a cross (x) on the number corresponding to your choice in the answer sheet provided.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.
  Further instructions are given on the back of the answer sheet. Follow theme carefully.

---

1. සංස්කෘත භාෂාවේ වෘද්ධි අක්ෂර සංඛ්‍යාව ඇතුළත් වරණය කුමක් ද?
   What is the number of *vṛddhi* letters in the Sanskrit language?
   (1) හතරකි four (2) පහකි five (3) හතකි seven (4) නවයකි nine

2. පහත සඳහන් ඒවායින් අඝෝෂ අක්ෂර වන්නේ මොනවා ද?
   Which of the following contains the *aghoṣa* letters?
   (1) च छ ट ठ ड । (2) च झ ट ड म । (3) क त ट प ह । (4) ख छ ठ थ फ ।

3. තාලුජාක්ෂර පමණක් අයත් වරණය වන්නේ,
   The option that contains only *tālujākṣarās* is,
   (1) इ ई क ख ङ । (2) इ च छ ज ञ । (3) ऌ त थ द न । (4) ई छ ज ङ ञ ।

4. **भानवः – कपिभिः** යන පදවල විභක්ති පිළිවෙළින් අයත් වරණය වන්නේ
   The option that contains the cases of भानवः – कपिभिः in the order is,
   (1) **प्रथमा – चतुर्थी ।** (2) **तृतीया – द्वितीया ।** (3) **प्रथमा – तृतीया ।** (4) **तृतीया – प्रथमा ।**

5. **आचार्ये – शालायाम् ।** යන පදවල අර්ථ වන්නේ,
   The meanings of the two words **आचार्ये – शालायाम्** are,
   (1) ගුරුවරයාට - ශාලාවෙන් to the teacher - from the hall
   (2) ගුරුවරයා කෙරෙහි - ශාලාවෙහි in the teacher - in the hall
   (3) ගුරුවරයා විසින් - ශාලාවට by the teacher - to the hall
   (4) ගුරුවරයාගේ - ශාලාවෙහි of the teacher - in the hall

6. <u>लोभात्</u> क्रोधं प्रभवति ।
   යටින් ඉරි ඇඳි පදයෙහි යෙදී ඇති කාරකය කුමක් ද?
   What is the *kāraka* of the underlined word of the given sentence?
   (1) **सम्प्रदानकारक ।** (2) **आधारकारक ।** (3) **अपादानकारक ।** (4) **करणकारक ।**

7. **फल** ශබ්දයෙහි තෘතීයා විභක්ති බහුවචනය වන්නේ,
   The *tṛtrīyā* bahuvacana of the stem फल is,
   (1) फलानाम् । (2) फलेभ्यः । (3) फलेषु । (4) फलैः ।

8. **वर्तते** යන ආඛ්‍යාත පදය අයත් වන්නේ කවරකට ද?
   Which of the verb वर्तते belongs to?
   (1) वर्तमान लट् आत्मनेपद प्रथमपुरुष एकवचनम् ।
   (2) लोट् आत्मनेपद मध्यमपुरुष एकवचनम् ।
   (3) लृट् परस्मैपद प्रथमपुरुष एकवचनम् ।
   (4) वर्तमान लट् परस्मैपद प्रथमपुरुष एकवचनम् ।

9. वदतु - अनमत् ආඛ්‍යාතවල ලකාර පිළිවෙළින් අයත් වරණය වන්නේ,

The option that contains the tenses (*lakāras*) of the verbs वदतु - अनमत् in that order is

(1) लट् - लोट् ।    (2) लृट् - लट् ।    (3) लोट् - लङ् ।    (4) लट् - लिट् ।

10. √हस् - लट् ලකාර පරස්මෛපද මධ්‍යමපුරුෂ බහුවචන රූපය තෝරන්න.

Select the present (लट् *lakāras*) *parasmaipada* second person plural form of √ हस्

(1) हसत ।    (2) हसेत ।    (3) हसथः ।    (4) हसथ ।

11. ලෝට් ලකාරයෙහි සූචිතාර්ථය වන්නේ

The indicative meaning of the लोट् लकार is,

(1) आज्ञार्थक ।    (2) अनद्यतनातीत ।    (3) श्वस्तन ।    (4) विधि ।

12. तत् + श्रुत्वा । යන්නෙහි නිවැරදි සන්ධිය වන්නේ කුමක් ද?

What is the correct *sandhi* form of तत् + श्रुत्वा ?

(1) तच्छ्रुत्वा ।    (2) तश्श्रुत्वा ।    (3) तच्श्रुत्वा ।    (4) तद्छ्रुत्वा ।

13. महोदधि යන්නෙහි නිවැරදි විසන්ධිය තෝරන්න.

The correct *visandhi* form of महोदधि is

(1) महा + उदधि ।    (2) महान् + उदधि ।    (3) महा + ओदधि ।    (4) मह + दधि ।

14. कस्त्वम् । යන සන්ධි පදය අයත් වන්නේ,

The *sandhi* form कस्त्वम् belongs to

(1) अनुस्वारसन्धिः ।    (2) व्यञ्जनसन्धिः ।    (3) स्वरसन्धिः ।    (4) विसर्गसन्धिः ।

15. वने भ्रमतोऽपि रविरस्तं गतः । මෙහි ඇතුළත් සන්ධි පද සංඛ්‍යාව

The number of *sandhi* words in वने भ्रमतोऽपि रविरस्तं गतः । is

(1) එකකි. one.    (2) දෙකකි. two.    (3) තුනකි. three.    (4) පහකි. five.

16. තත්පුරුෂ සමාසපදයක් වන්නේ කුමක් ද?

Which is an *tatpuruṣa* compound form ?

(1) वृक्षमूलम् ।    (2) वसिष्ठमुनिः ।    (3) पितरौ ।    (4) लम्बकर्णः ।

17. गुरुदेवः යන්න කුමන සමාසයට අයත් වන්නේ ද?

To which kind of compound does the word गुरुदेवः belong?

(1) तत्पुरुष समास ।    (2) द्वन्द्व समास ।    (3) बहुव्रीहि समास ।    (4) कर्मधारय समास ।

18. शासनिक යන්න කුමන තද්ධිතයට අයත් වන්නේ ද?

To which kind of *taddhita* noun does the word शासनिक belong?

(1) अनेकार्थ तद्धित ।    (2) भाव तद्धित ।    (3) अस्त्यर्थ तद्धित ।    (4) अव्यय तद्धित ।

19. गुणवान् යන තද්ධිතපදය අයත් ප්‍රත්‍යය වන්නේ

The *taddhita pratyaya* of गुणवान् is

(1) ईय ।    (2) वत् ।    (3) दा ।    (4) डिमन् ।

20. "<u>कृतस्य</u> करणं नास्ति ।" යටින් ඉරි ඇඳි පදය

The underlined word in "<u>कृतस्य</u> करणं नास्ति ।" is

(1) අනාගත කාල කෘදන්තයකි. a future participle.

(2) වර්තමාන කාල කර්මකාරක කෘදන්තයකි. a present passive participle.

(3) වර්තමාන කාල කර්තෘකාරක කෘදන්තයකි. a present active participle.

(4) අතීත කාල කෘදන්තයකි. a past participle.

21. √ भू धාතුවෙන් තැනෙන පූර්වක්‍රියා රූපය වන්නේ
The *Pūrvakriyā* form of root √ भू is
(1) भूत। (2) भवतु। (3) भूत्वा। (4) भवनीय।

22. कर्तव्य යන්නෙහි කෘදන්ත ප්‍රත්‍යය වෙන් වන්නේ කෙලෙස ද?
How does the participle suffix of कर्तव्य is separated?
(1) कृ + तव्य। (2) कर + तव्य। (3) कर् + तव्य। (4) कर्त + व्य।

23. අතීත කෘදන්ත පමණක් ඇති වරණය වන්නේ
The option that contains only *atītakṛdantas* is
(1) करणीयम् - करणम्। (2) कृतवान् - ज्ञातम्।
(3) दृष्टवान् - दर्शनीयम्। (4) गत्वा - गन्तुम्।

24. अकालमेघवद्वित्तम्। යන්නෙහි අර්ථය කුමක් ද?
The meaning of अकालमेघवद्वित्तम् is
(1) ජීවිතය අකලට උදා වූ වළාවක් බඳු ය.
The life is just like an untimely risen cloud.
(2) අකලට වට වැස්සක් සේ.
Like an untimely fallen rain.
(3) ධනය අකල් වළාවක් බඳු ය.
The wealth is just like an untimely risen cloud.
(4) අකලට උදා වූ වළාවක් බඳු ය.
just like an untimely risen cloud.

25. "6.30 ට" යටින් ඉරි ඇඳි පදයෙහි අර්ථය දැක්වෙන වරණය තෝරන්න.
Select the correct translation of the underlined phrase "at 6.30" is
(1) सार्ध षद्वादनम्। (2) सपाद पञ्चवादनम्।
(3) पादोन अष्टवादनम्। (4) पादाधिक षड्वादनम्।

26. "ගොඩක් ස්තුතියි" යන්නේ නිවැරදි පරිවර්තනය වන්නේ,
The correct translation of "a lot of thanks " is
(1) धन्यवादः। (2) बहुशः धन्यवादः।
(3) विजयलाभे अभिनन्दनम्। (4) आरोग्यं त्वरितं भूयात्।

27. भगवान् अस्ति। गच्छ යන වාක්‍යද්වය, සුදුසු පරිදි තනි වාක්‍යයක් ලෙස දැක්වෙන වරණය වන්නේ,
The suitably combined form of the two sentences भगवान् अस्ति। गच्छ is
(1) यत्र भगवान् अस्ति तत्र गच्छ। (2) यथा भगवान् अस्ति तथा गच्छ।
(3) यदा भगवान् अस्ति तदा गच्छ। (4) यदि भगवान् अस्ति तत्र गच्छ।

28. මහාකවි කාලිදාසයන්ගේ නාට්‍යයක් වන්නේ,
A drama of the great poet kālidāsa is
(1) रत्नावली। (2) अभिज्ञानशाकुन्तलम्।
(3) मृच्छकटिकम्। (4) मध्यमव्यायोगम्।

29. නාට්‍යයක කොටස් හඳුන්වනු ලබන නාමය කුමක් ද?
What is the name given for the parts of the Drama?
(1) अध्याय। (2) प्रवेशक। (3) भरत। (4) अङ्क।

30. සෞන්දරනන්ද මහාකාව්‍යයේ සුන්දරී විලාපය පිළිබඳ ව සඳහන් වන්නේ කවර පරිච්ඡේදයක ද?
Which canto of the *Saundarananda* mentions the repent of Sundarī
(1) द्वितीयसर्गे। (2) तृतीयसर्गे। (3) पञ्चमसर्गे। (4) षष्ठसर्गे।

31. භදන්තාශ්වඝෝෂාචාර්යපාදන්ගේ මහාකාව්‍යයක් වන්නේ
One of the great epics written by *bhadantāśvaghoṣa* is
(1) रघुवंशम्। (2) बुद्धचरितम्। (3) कुमारसम्भवम्। (4) जानकीहरणम्।

32. ලබ්ධප්‍රණාශය අයත් වන්නේ
The *labdhapraṇāśa* belongs to
(1) හිතෝපදේශයට ය. (2) පඤ්චතන්ත්‍රයට ය. (3) මහාභාරතයට ය. (4) රාමායණයට ය.
(1) Hitopadeśa. (2) Pañcatantra. (3) Mahābhārata. (4) Rāmāyaṇa.

33. වික්‍රමෝර්වශීය යනු
Vikramorvaśīya is
(1) ශතකකාව්‍යයකි. (2) ඛණ්ඩකාව්‍යයකි (3) මහාකාව්‍යයකි. (4) නාට්‍යයකි.
(1) a śatakakāvya. (2) a lyric poetry. (3) an Epic. (4) a Drama.

34. පිංගලක යනු
Piṁgalaka is
(1) නරියෙකි. (2) සිංහයෙකි. (3) අලියෙකි. (4) පක්ෂියෙකි.
(1) a fox. (2) a lion. (3) an Elephant. (4) a bird.

35. අමරශක්ති රජු විසූ නගරය කුමක් ද?
What is the name of the city where king Amaraśakti lived?
(1) පාටලීපුත්‍ර (2) හස්තිනාපුර (3) අයෝධ්‍යාපුර (4) කපිලවස්තුපුර
(1) Pāṭalīputra. (2) Hastināpura (3) Ayodhyāpura (4) Kapilavastupura

36. පඤ්චතන්ත්‍රයෙහි අපට හමුවන කපටි සිවලුන් දෙදෙනා විසින් රවටනු ලබන්නේ කවරෙක් ද?
Whom was cheated by two jackals mentioned in pañcatantra?
(1) කරටක (2) දන්තිල (3) සංජීවක (4) සංකට
(1) karaṭaka (2) Dantila (3) Sañjīvaka (4) Saṃkaṭa

37. මහාකවි කාලිදාසයන්ගේ ශ්‍රේෂ්ඨ ඛණ්ඩකාව්‍යයක් වන්නේ,
A great lyric poetry composed by Kālidāsa is
(1) रघुवंशम्। (2) सेतुबन्धम्। (3) गीतगोविन्दम्। (4) मेघदूतम्।

38. "බ්‍රාහ්මණ සර්පකථා" අන්තර්ගත කාණ්ඩය කුමක් ද?
In which chapter does the story of "brāhmaṇasarpakathā" mention?
(1) मित्रभेद। (2) अपरीक्षितकारक। (3) काकोलूकीय। (4) लब्धप्रणाश।

39. මේඝදූතයෙහි කොටස් දෙක වන්නේ
The two part of Meghadūta are
(1) पूर्वसर्ग - उत्तरसर्ग। (2) प्रथमभाग - द्वितीय भाग
(3) पूर्वमेघ - उत्तरमेघ। (4) प्रथमपर्व - द्वीतीयपर्व।

40. දිලීප යනු කවරෙක් ද?
Who is dilīpa ?
(1) සෞන්දරනන්දයෙහි චරිතයකි. (2) රත්නාවලියෙහි චරිතයකි.
(1) A charactor of Saundarananda (2) A charactor of Ratnāvalī
(3) මහාභාරතයෙහි චරිතයකි. (4) රඝුවංශයෙහි චරිතයකි.
(3) A charactor of Mahābhārata (4) A charactor of Raghuvaṁśa

### 2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 1. | 2 | 21. | 3 |
| 2. | 4 | 22. | 1 |
| 3. | 2 | 23. | 2 |
| 4. | 3 | 24. | 3 |
| 5. | 2 | 25. | 1 |
| 6. | 3 | 26. | 2 |
| 7. | 4 | 27. | 1 |
| 8. | 1 | 28. | 2 |
| 9. | 3 | 29. | 4 |
| 10. | 4 | 30. | 4 |
| 11. | 1 | 31. | 2 |
| 12. | 1 | 32. | 2 |
| 13. | 1 | 33. | 4 |
| 14. | 4 | 34. | 2 |
| 15. | 2 | 35. | සියල්ලම |
| 16. | 1 | 36. | 3 |
| 17. | 4 | 37. | 4 |
| 18. | 3 | 38. | 3 |
| 19. | 2 | 39. | 3 |
| 20. | 4 | 40. | 4 |

වගුව 5

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.


### 2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ තේමා අනුව


I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සකස් කිරීමේ දී පදනම් කරගත් තේමා / විෂය ක්ෂේත්‍ර 09 කි. ඒ ඒ තේමා අනුව ප්‍රශ්න සකස් වී ඇති ආකාරය මෙසේය.

| තේමාව / විෂය ක්ෂේත්‍රය | ප්‍රශ්න අංකය |
|---|---|
| වර්ණ මාලාව | 1, 2, 3 |
| නාම වරනැගීම | 4, 5, 6, 7 |
| ලකාර | 8, 9, 10, 11 |
| සන්ධි | 12, 13, 14, 15 |
| සමාස | 16,17 |
| තද්ධිත | 18,19 |
| කෘදන්ත | 20, 21, 22, 23 |
| වාක්‍ය නිර්මාණ | 24, 25, 26, 27 |
| සාහිත්‍යය | 28, 29, 30, 31, 32, 33, 34, 35, 36, 37, 38, 39, 40 |

වගුව 6

ප්‍රස්තාරය 5 අනුව I ප්‍රශ්න පත්‍රයෙහි තේමා විෂය ක්ෂේත්‍ර 09 අතුරෙන් වැඩිම ප්‍රශ්න සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇත්තේ සාහිත්‍ය තේමාව විෂය ක්ෂේත්‍රය යටතේ වන අතර ඉදිරිපත් වී ඇති ප්‍රශ්න සංඛ්‍යාව 13කි. මෙම තේමාව යටතේ පහසුතාව වැඩිම ප්‍රශ්නය 36 වන ප්‍රශ්නයයි එහි පහසුතාවය 72%කි. 50%ක් හෝ ඊට වැඩි පහසුතාවයක් ඇති ප්‍රශ්න 7කි. ඒවා නම්, 28 ,31, 32,34,35,36, සහ 37 ප්‍රශ්නයි. සාහිත්‍ය තේමාව යටතේ 30%ක් හෝ ඊට අඩු පහසුතාවයක් ඇති ප්‍රශ්න 02කි. ඒවා නම් 30, 38 ප්‍රශ්නයි.
I ප්‍රශ්න පත්‍රයෙහි පහසුතාව අඩුම ප්‍රශ්නය සන්ධි තේමාව යටතේ ඉදිරිපත් වී ඇති 14වන ප්‍රශ්නය සහ වාක්‍ය නිර්මාණය තේමාව යටතේ ඉදිරිපත් වී ඇති 24වන ප්‍රශ්නයයි.


මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019
04 - සංස්කෘත - I පත්‍රය
ප්‍රශ්න වල පහසුතා දර්ශකය
ප්‍රශ්න අංකය
වර්ණ මාලාව
නාමවර නැඟීම
ලකාර
සන්ධි
සමාස
තද්ධිත
කෘදන්ත
වාක්‍ය නිර්මාණය
සාහිත්‍යය




ප්‍රස්තාරය 5 I

| **ප්‍රශ්න අංකය** | **විෂය ක්ෂේත්‍රය** | **පහසුතාව වැඩි ම ප්‍රශ්නය හා එහි පහසුතාව** | **පහසුතාව අඩු ම ප්‍රශ්නය හා එහි පහසුතාව** | **ප්‍රශ්නවල සමස්ත පහසුතාවය** |
|---|---|---|---|---|
| 1, 2, 3 | වර්ණමාලාව | 3 (73%) | 1 (39%) | 55% |
| 4,5,6,7 | නාම වරනැගීම | 4 (68%) | 5 (29%) | 47% |
| 8,9,10,11 | ලකාර | 9 (58%) | 11 (27%) | 46% |
| 12,13,14,15 | සන්ධි | 15 (67%) | 14 (25%) | 41% |
| 16,17 | සමාස | 17 (33%) | 16 (29%) | 31% |
| 18,19 | තද්ධිත | 19 (54%) | 18 (31%) | 42% |
| 20,21,22,23 | කෘදන්ත | 21 (51%) | 20 (27%) | 35% |
| 24,25,26,27 | වාක්‍ය නිර්මාණ | 26 (69%) | 24 (25%) | 45% |
| 28,29,30,31,32,33,34,35 36,37,38,39,40 | සාහිත්‍යය | 36 (72%) | 38 (26%) | 54% |

වගුව 6 I

## 2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | කිසිදු පිළිතුරක් සපයා නොමැත |
| 1 | 2 | 50.67 | 39.20 | 5.12 | 4.50 | 0.51 |
| 2 | 4 | 6.45 | 8.29 | 32.04 | 53.12 | 0.10 |
| 3 | 2 | 4.81 | 72.98 | 19.04 | 3.17 | 0.00 |
| 4 | 3 | 16.99 | 10.03 | 68.07 | 3.99 | 0.92 |
| 5 | 2 | 23.95 | 29.07 | 20.06 | 26.00 | 0.92 |
| 6 | 3 | 13.10 | 28.45 | 33.98 | 23.95 | 0.52 |
| 7 | 4 | 11.16 | 28.97 | 4.30 | 55.17 | 0.40 |
| 8 | 1 | 43.40 | 17.30 | 18.73 | 19.45 | 1.12 |
| 9 | 3 | 13.51 | 15.76 | 57.73 | 12.69 | 0.31 |
| 10 | 4 | 13.10 | 10.03 | 22.21 | 54.35 | 0.31 |
| 11 | 1 | 27.23 | 32.65 | 17.20 | 21.70 | 1.22 |
| 12 | 1 | 25.79 | 39.61 | 20.47 | 13.51 | 0.62 |
| 13 | 1 | 45.55 | 10.64 | 35.82 | 7.68 | 0.31 |
| 14 | 4 | 11.67 | 43.71 | 19.04 | 24.87 | 0.71 |
| 15 | 2 | 14.33 | 67.04 | 13.61 | 4.61 | 0.41 |
| 16 | 1 | 28.97 | 23.13 | 26.20 | 20.16 | 1.54 |
| 17 | 4 | 24.05 | 20.78 | 21.19 | 33.37 | 0.61 |
| 18 | 3 | 24.97 | 30.71 | 30.60 | 12.90 | 0.82 |
| 19 | 2 | 14.23 | 53.63 | 9.01 | 22.62 | 0.51 |
| 20 | 4 | 24.87 | 19.34 | 28.15 | 26.51 | 1.13 |
| 21 | 3 | 11.67 | 32.96 | 51.18 | 4.09 | 0.10 |
| 22 | 1 | 34.70 | 26.10 | 25.08 | 13.61 | 0.51 |
| 23 | 2 | 25.18 | 27.84 | 21.39 | 25.38 | 0.21 |
| 24 | 3 | 18,42 | 16.89 | 24.56 | 39.41 | 0.72 |
| 25 | 1 | 53.94 | 15.97 | 12.08 | 17.71 | 0.30 |
| 26 | 2 | 10.95 | 68.78 | 12.38 | 7.47 | 0.42 |
| 27 | 1 | 32.86 | 18.94 | 22.42 | 24.77 | 1.01 |
| 28 | 2 | 10.75 | 70.11 | 11.16 | 7.78 | 0.20 |
| 29 | 4 | 14.02 | 26.31 | 26.71 | 32.75 | 0.21 |
| 30 | 4 | 12.49 | 29.68 | 29.17 | 27.33 | 1.33 |
| 31 | 2 | 9.21 | 69.81 | 12.28 | 8.09 | 0.61 |
| 32 | 2 | 16.89 | 61.72 | 11.67 | 9.62 | 0.10 |
| 33 | 4 | 12.49 | 29.48 | 13.00 | 43.91 | 1.12 |
| 34 | 2 | 27.23 | 60.39 | 6.35 | 5.22 | 0.81 |
| 35 | 1,2,3,4 | 25.18 | 18.12 | 49.74 | 6.55 | 0.41 |
| 36 | 3 | 12.28 | 10.24 | 71.95 | 5.22 | 0.31 |
| 37 | 4 | 24.16 | 7.68 | 15.05 | 52.41 | 0.70 |
| 38 | 3 | 15.56 | 45.85 | 25.59 | 11.77 | 1.23 |
| 39 | 3 | 16.38 | 23.95 | 43.91 | 14.94 | 0.82 |
| 40 | 4 | 13.51 | 18.01 | 19.24 | 48.72 | 0.52 |

වගුව 7

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

### 2.1.6 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

2019 වර්ෂයේ සංස්කෘත විෂය I පත්‍රය සැකසීමේ දී සාහිත්‍ය තේමාවට අදාළව ප්‍රශ්න 13ක් ද, නාමවර නැගීම, ලකාර සන්ධි කෘදන්ත හා වාක්‍ය නිර්මාණය සහ තේමාවන්ට අදාලව ප්‍රශ්න 04 බැගින් ද වර්ණමාලාවට අදාළව ප්‍රශ්න 03ක්ද සමාස හා තද්ධිත යන තේමා සඳහා ප්‍රශ්න 02 බැගින් ද ඉදිරිපත් කර ඇත.

වර්ණ මාලාව නම් ඒකකයට (නිපුණතාවට) අනුව සකස් වී ඇති 1 , 2 හා 3 යන ප්‍රශ්න අතුරින් 3වන ප්‍රශ්නය සඳහා පහසුතාව 73%කි. 1 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 39%ක ප්‍රමාණයකි. මෙම ඒකකයට අදාළ 1 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් 51%ක් පමණ පිළිතුර ලෙස තෝරා ගෙන ඇත්තේ පළමු වරණයයි. අපේක්ෂකයන් බහුතරයක් එලෙස පළමු වරණය තෝරා ගෙන ඇත්තේ, අක්ෂර මාලාවේ ප්‍රධාන ප්‍රභේදයන්ට අදාළ අක්ෂර සංඛ්‍යාව පිළිබඳ මනා අවබෝධයක් නොතිබීම නිසාය. ගුණ හා වෘද්ධි ආදි අක්ෂර ප්‍රභේද හඳුනා ගැනීමත්, ඒ ඒ ප්‍රභේදයන්ට අදාළ අක්ෂර සංඛ්‍යාව අවබෝධ කර ගැනීම සඳහාත් ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ප්‍රමුඛතාව ලබා දිය යුතු ය.

නාම වරනැගීම විෂය ක්ෂේත්‍රයට අදාළ 4, 5, 6, 7 යන ප්‍රශ්න අතුරින් වැඩිම පහසුතාවක් 4 වන ප්‍රශ්නය පෙන්නුම් කර ඇත. එහි පහසුතාව 68%කි. අඩුම පහසුතාවක් පෙන්නුම් කර ඇත්තේ 5වන ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 29%කි. 5වන ප්‍රශ්නයට පිළිතුර ලෙස අපේක්ෂකයන් වරණ හතරම සමාන ප්‍රතිශතයකින් තෝරාගෙන ඇත. පිළිතුර සඳහා අපේක්ෂකයාට වරණ සතරම තෝරා ගැනීමට හේතු වූයේ නාම වරනැගිල්ලෙහි ලිංග භේදය හා අර්ථය පිළිබඳ අවබෝධය අවම වීමයි. නාම වරනැගීමේ දී ලිංග භේදය හා විභක්ති අර්ථය පිළිබඳ දැනුම ලබාදීමට ප්‍රමුඛතාවක් ලබාදීමට යෝජනා කෙරේ.

ලකාර විෂය ක්ෂේත්‍රයට අදාළ 8,9,10,11 ප්‍රශ්න අතුරින් පහසුතාව වැඩිම ප්‍රශ්නය 9වන ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 58%කි. අවම පහසුතාව 11වන ප්‍රශ්නයට ලැබී ඇත. එහි පහසුතාව 27%කි. අපේක්ෂකයන් 33%ක් පිළිතුර ලෙස 2වරණය තෝරා ගෙන ඇත. එයට හේතුව වනුයේ ලකාරයන්හි අර්ථ පිළිබඳ නිසි අවධානයක් යොමු නොකිරීමයි. පෙළ පොතෙහි ලකාරය සඳහා ලබා දී ඇති පර්යාය වචන පිළිබඳ සැලකිල්ලක් නොදැක්වීමයි. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පෙළපොත නිසිලෙස පරිහරණය කිරීමත් ලකාර වරනැගීම හා ඒවායෙහි අර්ථ පිළිබඳ අවබෝධය ලබාදීම සුදුසු වේ.

සන්ධි විෂය ක්ෂේත්‍රයට අදාළ 12, 13 ,14, 15 ප්‍රශ්න අතුරින් අපේක්ෂකයන් වැඩිම පහසුතාව දක්වා ඇත්තේ 15වන ප්‍රශ්නයට ය. එහි පහසුතාව 67% කි. අවම පහසුතාවක් පෙන්නුම් කර ඇත්තේ 14වන ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 25%කි. අපේක්ෂකයන් 44%ක ප්‍රතිශතයක් පිළිතුර ලෙස තෝරා ඇත්තේ 2වන වරණයයි. අපේක්ෂකයන් සංස්කෘත භාෂාවෙන් දක්වා ඇති සන්ධි පදයක් නිවැරදිව විශ්ලේෂණය කර ගැනීමේ දුර්වලතාවෙන් යුක්ත ය. සන්ධි ප්‍රභේදයන් හඳුනා ගැනීමට ඇති මූලික ලක්ෂණ පිළිබඳ සුවිශේෂ අවධානයක් යොමු කරමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීමට යෝජනා කෙරේ.

සමාස විෂය ක්ෂේත්‍රයට අදාළ 16,17වන ප්‍රශ්න අතුරින් 17වන ප්‍රශ්නය සඳහා 33%ක වැඩි පහසුතාවක්පෙන්නුම් කර ඇති අතර 16වන ප්‍රශ්නය සඳහා 29%ක අඩු පහසුතාවක් පෙන්නුම් කර ඇත. අපේක්ෂකයන් සෑම වරණයක් සඳහාම සමාන ප්‍රතිශතයක් ලබාගෙන තිබීම විශේෂ වේ. එහෙයින් විභාග අපේක්ෂකයාට පිළිතුර මගින් කිසිදු ඉඟියක් නොලැබුණු අතර නිවැරදි පිළිතුර තෝරා ගැනීමේ දී සමාස පිළිබඳ මූලික අවබෝධය ලබා නොමැති බව පෙනේ. සමාස පිළිබඳ මූලික ප්‍රභේද පිළිබඳ අවබෝධය ලබාදීමට යෝජනා කෙරේ. ඒ සඳහා සරල/ ප්‍රායෝගික උදාහරණ මෙන්ම පෙළපොත නිර්දිෂ්ට ග්‍රන්ථ ද භාවිත කිරීම සිදු කළ යුතු ය.

තද්ධිත විෂය ක්ෂේත්‍රයට අදාළව 18 ,19වන ප්‍රශ්න අතුරින් 19වන ප්‍රශ්නය සඳහා 54%ක වැඩි පහසුතාවක් පෙන්නුම් කර ඇති අතර 18වන ප්‍රශ්නය සඳහා 31%ක අඩු පහසුතාවක් පෙන්නුම් කර ඇත. මෙහි දී තද්ධිත ප්‍රභේද හා ප්‍රත්‍යයන් හි අර්ථ පිළිබඳ අවබෝධයක් විභාග අපේක්ෂකයා තුළ නොමැති බව පෙ-නේ. තද්ධිත යනු, ප්‍රත්‍යාර්ථ නාමයි. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී තද්ධිතවල ප්‍රත්‍ය පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමට යෝජනා කෙරේ.

කෘදන්ත විෂය ක්ෂේත්‍රයට අදාළ 20, 21, 22, 23 යන ප්‍රශ්න අතුරින් විභාග අපේක්ෂකයන් ඉහළ පහසුතාවක් පෙන්නුම් කර ඇත්තේ 21වැනි ප්‍රශ්නයට ය. එහි පහසුතාව 51%කි. අවම පහසුතාවක් පෙන්වා ඇත්තේ 20වන ප්‍රශ්නයට වන අතර එහි පහසුතාව 27%කි. අපේක්ෂකයන් වැඩි පිරිසක් පිළිතුර ලෙස තෝරා ඇත්තේ 3වන වරණයයි. එය ප්‍රතිශතයක් ලෙස 28%කි. කෘදන්ත ව්‍යාකරණ ලෙස ඉගෙනුම් ක්‍රියාවලියේ දී යොදා ගෙන තිබුණ ද ප්‍රායෝගික භාවිතයේ දී කෘදන්ත පද හඳුනා ගැනීමේ දුර්වලතාවක් දක්වයි. ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොදා ගැනෙන ව්‍යාකරණ ප්‍රායෝගික භාවිතය සඳහා යොදා ගන්නා ආකාරය පිළිබඳ අවධානය යොමු කිරීමට යෝජනා කෙරේ.

වාක්‍ය නිර්මාණය විෂය ක්ෂේත්‍රයට අදාළ 24, 25, 26, 27 ප්‍රශ්න අතුරින් 26වන ප්‍රශ්නය 69%ක පහසුතාවක් පෙන්නුම් කර ඇත. 24වන ප්‍රශ්නය අඩුම පහසුතාවක් පෙන්නුම් කර ඇති අතර එහි පහසුතාව 25%කි. අපේක්ෂකයන් 39%ක් පිළිතුර ලෙස තෝරා ඇත්තේ 3වන වරණයයි. සංස්කෘත දේවනාගරී නගර පෙළ කියවීමේ දුර්වලතාව, වාක්‍යයේ පද විශ්ලේෂණය කර ගැනීමේ අපහසුතාව හා පර්යාය පද පිළිබඳ අවබෝධය අඩුවීම බලපා ඇත. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පාඨ ග්‍රන්ථ කියවීමේ දී නගර අක්ෂරයන් හි සංයුක්තාක්ෂර භාවිතයට හුරු කරවීම, වාක්‍යයක පද බෙදා දැක්වීමට ශිෂ්‍යයා උනන්දු කරවීම පර්යාය පද පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ශිෂ්‍යයා යොමු කරවීමට කටයුතු කල යුතු ය.

සාහිත්‍ය විෂය ක්ෂේත්‍රයට අදාළ 28, 29, 30, 31, 32, 33, 34, 35, 36, 37, 38, 39, 40 යන ප්‍රශ්න අතුරින් 36වන ප්‍රශ්නයෙහි පහසුතාව 72%කි. අවම පහසුතාවක් පෙන්නුම් කර ඇත්තේ 38වන ප්‍රශ්නයට වන අතර එහි පහසුතාව 26%කි. අපේක්ෂකයන්ගෙන් 46%ක ප්‍රතිශතයක් පිළිතුර ලෙස තෝරා ඇත්තේ 3වන වරණයයි. ඉතා ඉහළ ප්‍රතිශතයක් ලැබීමට හේතු වී ඇත්තේ විෂය නිර්දේශය ගුරු අත්පොත හා නිර්දිෂ්ට ග්‍රන්ථයන් හි මාතෘකාව යොදා තිබීමේ විෂමතාවයි. විෂය නිර්දේශයේ හා ගුරු අත්පොතෙහි දක්වා ඇති ප්‍රධාන කතා නාමය නිර්දිෂ්ට පාඨමාලා ග්‍රන්ථයේ සඳහන් නොවේ. අපේක්ෂකයා පරිහරණය කරනුයේ නිර්දිෂ්ට පාඨමාලා ග්‍රන්ථයයි. එසේම සම්භාව්‍ය ග්‍රන්ථයන්ගෙන් උපුටා දක්වා ඇති කතා කොටස්වල මූලග්‍රන්ථය පිළිබඳ අවබෝධය ද අවම ය. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේදී විෂය නිර්දේශයේ හා ගුරු අත්පොතෙහි ඇති පාඩමට අදාළ මාතෘකාව නිර්දිෂ්ට පාඨමාලා ග්‍රන්ථයන් හි යෙදීම ද උපුටා ගත් ග්‍රන්ථ හා කතුවරුන් පිළිබඳ අවබෝධයක් ලබා දීමටත් යෝජනා කෙරේ.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**II** පත්‍රය - කාලය **:** පැය 03යි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත ය.


**I** කොටස - අනිවාර්ය ප්‍රශ්න දෙකකින් සමන්විත ය.
එක් ප්‍රශ්නයකට ලකුණු **12** බැගින් ලකුණු **24**කි.

**II** කොටස - ප්‍රශ්න හයකින් සමන්විත ය. ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
එක් ප්‍රශ්නයකට ලකුණු **12** බැගින් ලකුණු **36**කි.

**II** පත්‍රය සඳහා මුළු ලකුණු = **24 + 36 = 60**

| | | | |
|---|---|---|---|
| අවසාන ලකුණ ගණනය කිරීම : | **I** පත්‍රය | = | **40** |
| | **II** පත්‍රය | = | **60** |
| | අවසාන ලකුණ | = | **100** |

## 2.2.2 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




ප්‍රස්තාරය 5 ( RD /16/4/ MPF ෆෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකසන ලදී )

ඉහත වගුවට අනුව 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වුවත් අපේක්ෂකයන් වැඩි පහසුතාවක් ප්‍රදර්ශනය කොට ඇත්තේ 2වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ය. එහි පහසුතාව 45%කි.

- ඒ සඳහා නිර්දිෂ්ට ගද්‍ය හා පද්‍ය උද්ධෘත ඉගැන්වීමේ ක්‍රියාවලිය යාවත්කාලීන කළ යුතු ය. අර්ථය වාචෝද්ගත කිරීම පමණක් ප්‍රමාණවත් නැත. උද්ධෘත ආශ්‍රයෙන් පරිවර්තන අභ්‍යාස කිරීම ද අත්‍යවශ්‍ය වේ.

- අනිවාර්ය වන I කොටසේ 2වන ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේ දී පෙළ පොතෙහි සඳහන් උද්ධෘත මාතෘකා පාඨ හා විශේෂ උද්ධෘත අධ්‍යාපනය සඳහා අවධානය යොමු කළ යුතු වේ.

- 3වන ප්‍රශ්නයේ සිට 8වන ප්‍රශ්නය දක්වා ප්‍රශ්න අතුරින් 4වන ප්‍රශ්නය සඳහා පහසුතාව 45%කි. 29%ක අඩු පහසුතාවක් පෙන්නුම් කර ඇත්තේ 8වන ප්‍රශ්නය සඳහාය.

- 8වන ප්‍රශ්නය අපේක්ෂකයන්ගේ නිර්මාණශීලී හැකියාව පරීක්ෂණයට ඇති එකම ප්‍රශ්නයයි. සංස්කෘත විෂය භාෂාවක් වන නිසා එම ශක්‍යතාව අපේක්ෂකයන් තුළ සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ නිසා සංස්කෘතයෙන් මාතෘභාෂාවටත්, මාතෘභාෂාවෙන් සංස්කෘතියටත් වාක්‍යය පරිවර්තනය සඳහා පුහුණුව ලබා දිය යුතු බවට යෝජනා කෙරේ.

## 01 ප්‍රශ්නය

01. (i) පහත සඳහන් ගද්‍යපාඨ සිංහලයට නගන්න.
Translate the following prose quotations into English.

**१. न केनापि शोचनीयं मे मरणम्।**

කවරකු විසින් වත් මාගේ මරණයට ශෝක නොකටයුතු යි.

**२. न कदापि मतभेदो जायतां मम पुत्रेषु युष्मासु।**

මාගේ පුත්‍රයන් වූ නුඹලා කෙරෙහි කිසිකලෙකත් මතබේදයක් නූපදීවා

**३. कस्मिंश्चिदधिष्ठाने देवशर्मा नाम ब्राह्मणः प्रति वसति स्म।**

කිසියම් ප්‍රදේශයක දේවශර්මා නම් බමුණෙක් වාසය කළේ ය.

(ii) පහත සඳහන් පද්‍යපාඨ සිංහලයට නගන්න.
Translate the following verse quotations into English.

**१. सा हासहंसा नयनद्विरेफा।**

සිනහව නැමැති හංසයන් හා ඇස් නැමැති මීමැස්සන් ඇති ඇය

**२. न कूपखननं युक्तं प्रदीप्ते वह्निना गृहे।**


ගෙය ගිනිගත් කල්හි ළිඳ හැරීම සුදුසු නොවේ.

**३. परिवर्तिनि संसारे मृतः को वा न जायते।**

පෙරළෙන සසරෙහි මැරුණු කවරෙක් නම් නූපදී ද?

### 01වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා


**ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය**




පළමු ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි.
අපේක්ෂකයන් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේ දී 38%ක පහසුතාවක් දක්වා ඇත. ලකුණු ලබා ගැනීමේ දී,

0 - 3 ප්‍රාන්තරයේ 47 %ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 35 %ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 12 %ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 6 %ක් ද,
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 10ට වඩා ලබාගත් පිරිස 6%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 47%ක්ම ලබා ගෙන ඇත්තේ ලකුණු 3ට අඩුවෙනි.




★මෙම ප්‍රශ්නයෙහි කොටස් දෙකකි. එහි පළමු කොටස නිර්දිෂ්ට ගද්‍ය පාඨ අතුරින් ලබා දී ඇති අතර, දෙවන කොටස නිර්දිෂ්ට පද්‍ය පාඨ අතුරින් ලබා දී ඇත. පළමු කොටස සඳහා පහසුතාව 57%කි. දෙවන කොටස සඳහා පහසුතාව 19%කි.

නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨවල අර්ථ පාඩම් ගැනීම මෙන් ම ගද්‍ය පද්‍ය පාඨයන් හි වාක්‍ය බණ්ඩ පිළිබඳ පරිවර්තන අභ්‍යාස සඳහා සිසුන් හුරු කිරීමට **යෝජනා කෙරේ.**

02. (i) प्रारब्धमुत्तमजना न परित्यजन्ति ।

මේ ප්‍රකාශයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

Explain the significance of this statement.

**උත්සාහයෙහි ඇති වැදගත්කම මෙන් ම ආරම්භ කරන ලද කටයුතු අතර මග අත්හැර නොදමන පුද්ගලයන්ගේ උසස් බව අවධාරණය කරමින් කරුණු දක්වා තිබීම කෙරෙහි අවධානය යොමු කරන්න.**

(ලකුණු 04)
(04 Marks)

(ii) නිර්දිෂ්ටපාඨ ග්‍රන්ථාගත ගද්‍ය හා පද්‍ය ප්‍රකාශ ආශ්‍රයෙන් පහත සඳහන් මාතෘකා අතුරෙන් එකක් පිළිබඳ විවරණයක් කරන්න. *(ලකුණු 08 යි)*

Make a review on either of following topics based on prescribed verse and prose statements. *(08 marks)*

(අ) අවමානය විනාශයට මුල් වේ.


(a) The disgrace is the cause of destruction.

(ආ) අපරීක්ෂාකාරීවීමෙන් අනිටු විපාක උදා වේ.

(b) Being careless bring unpleasant results.

**නියමිත ඉඩ නිසි පරිදි ප්‍රයෝජනයට ගෙන තිබිය යුතුය මාතෘකාවට අදාළව පිළිතුර ලියා තිබිය යුතුය. ප්‍රධාන මාතෘකාවන්ට අදාළ නිර්දිෂ්ට කරාව ඔස්සේ කරුණු ඉදිරිපත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය සසඳා බලා ලකුණු දෙන්න.**


**02 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා**




දෙවන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. අපේක්ෂකයන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී 45% ක පහසුතාවක් දක්වා ඇත. ලකුණු ලබා ගැනීමේ දී,

0 - 3 ප්‍රාන්තරයේ 18 % ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 33 % ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 42 % ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 7 % ක් ද,
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ට වඩා ලබාගත් පිරිස 7%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 49%ක්ම ලකුණු 7-12ත් අතර ලබාගෙන ඇත.




★මෙහි දෙවෙනි කොටසේ අනුකොටස් දෙකකි. (ii) (a) අනුකොටස සඳහා 48%ක පහසුතාවක් ද (ii) (b) අනුකොටස සඳහා 72%ක ඉහළ පහසුතාවක් ද පෙන්නුම් කර ඇත. පහසුතාව අඩුම කොටස වන්නේ (i) කොටසයි. එහි පහසුතාව 16%කි.

★මෙම ප්‍රශ්නය විශ්ලේෂණාත්මක හා නිර්මාණාත්මක හැකියාව මැන බැලෙන්නෙකි. (ii) (a) අනුකොටසට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් තුළ පෙළපොතෙහි සඳහන් මාතෘකා පාඨ හා විශේෂ උද්ධෘත අධ්‍යයනය සඳහා අවධානය යොමු කිරීමට යෝජනා කෙරේ.

★ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ උද්ධෘත පාඨ ආශ්‍රයෙන් නිර්මාණාත්මක වැකි කිහිපයක් ලිවීමට හුරුකරවීමට යෝජනා කෙරේ.

★ සිංහල ගද්‍ය පාඨ පරිවර්තනයට පෙර සිංහල භාෂාවෙන් කතාව කියා දී ශිෂ්‍යයාට එම කතාව මතකයෙන් ලිවීම, චිත්‍ර ආශ්‍රයෙන් ඇඳ දක්වීම ආදි ශිෂ්‍ය ක්‍රියාකාරකම්වල යෙදවීමට යෝජනා කෙරේ.

03. (i) इ කාරයෙහි වෘද්ධි අක්ෂරය කුමක් ද?
What is the *vṛddhi* form of इ is ?

..........................................................................................

..........................................................................................

(ii) පහත සඳහන් සාරස්වත සූත්‍රවල තේරුම ලියන්න.
Write the meaning of the following *Sārasvata sūtrās*.

१. अ इ ए। : අවර්ණයෙන් පරව ඉ වර්ණය සිටි කල්හි එම අවර්ණ ඉවර්ණ දෙකට ඒ වේ.

२. इयं स्वरे। : ඉවර්ණය හැර වෙනත් ස්වරයක් පර කල්හි ඉ වර්ණයට ය වර්ණය ආදේශ වේ.

३. वर्णविरोधो लोपश्च। : දෙපස අකුරු නැවත එකතු වී සන්ධි නොවන සේ අකුරු ඉවත් වීම ලෝපශ් නම් වේ.

४. अकुहविसर्जनीयानां कण्ठः। : අ, ආ, ක, ඛ, ග, ඝ, ඞ, හ, (අ)ඃ යන අකුරු කණ්ඨජ නම් වේ.

(iii) පහත සඳහන් සන්ධිපද විසන්ධි කරන්න.
Disjoin the following *sandhi* forms.

१. सदैव। : सदा + एव


२. मद्वचः। : मत् + वचः

३. नकुलोऽपि। : नकुलः + अपि

(iv) इतस्ततः / लोभाभिभूत / स्वर्गादपि යන සන්ධිපද සුදුසු පරිදි වගුගත කරන්න. *(ලකුණු 03 යි)*
Complete the following table with the appropriate *sandhi* forms इतस्ततः / लोभाभिभूत / स्वर्गादपि.
*(03 marks)*

| स्वरसन्धि | व्यञ्जनसन्धि | विसर्गसन्धि |
|---|---|---|
| लोभाभिभूत | स्वर्गादपि | इतस्ततः |


### 03වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා




තුන්වන ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් 37%ක පහසුතාවක් පෙන්වා ඇත. ලකුණු ලබා ගැනීමේ දී,

0 - 3 ප්‍රාන්තරයේ 50 %ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 34%ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 11 %ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 05 %ක් ද,
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 වඩා ලබාගත් පිරිස 5%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 50%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 3ට අඩුවෙනි.




⋆සාරස්වත සූත්‍ර හා සන්ධි ඇසුරෙන් මැන බැලෙන නිපුණතාවකි. මෙහි කොටස් 4කි. 3 (i) කොටස සඳහා පහසුතාව 46%ක් ද, 3 (ii) කොටස සඳහා පහසුතාව 30%ක් ද, 3( iii ) කොටස සඳහා පහසුතාව 27%ක් ද, 3 (iv) කොටස සඳහා පහසුතාව 46%ක් ද වේ.

⋆ පෙළපොතට අදාළ මූලික සාරස්වත සූත්‍ර අර්ථ සහිතව වාචෝද්ගත කිරීමට යෝජනා කරයි.

⋆ ප්‍රායෝගික ව්‍යවහාරයේ දී භාවිත වන සන්ධි පද අයත් වන සන්ධි ප්‍රභේදය හඳුනාගෙන

04. (i) ऋते යන්න යෙදෙන්නේ ......පඤ්චමී...... විභක්තිය සමගයි. *(ලකුණු 02 යි)*

ऋते governs the .........Ablative......... case. *(02 marks)*

(ii) පහත සඳහන් පදවල විභක්තිය හා වචනය ලියන්න. *(ලකුණු 04 යි)*

Write the case and the number of the following words. *(04 marks)*

| පදය (word) | විභක්තිය (case) | වචනය (number) |
|---|---|---|
| ताः | ප්‍රථමා | බහුවචන |
| अग्रजे | සප්තමී | ඒකවචන |
| कपिषु | සප්තමී | බහුවචන |
| बन्धुभिः | තෘතීයා | බහුවචන |


(iii) පහත සඳහන් ආදර්ශ පද රටාව දෙස බලා, හිස්තැනට ගැළපෙන වචනය ලියන්න. *(ලකුණු 06 යි)*

Look at the word pattern of the given example and fill in the blanks with the appropriate words accordingly. *(06 marks)*

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| *प्रथमा* | *नरः* | *नरौ* | *नराः* |
| प्रथमा | लता | लते | लताः |
| द्वितीया | साधुम् | साधू | साधून् |
| पञ्चमी | पितुः | पितृभ्याम् | पितृभ्यः |
| सप्तमी | भानौ | भान्वोः | भानुषु |

**04වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා**


**ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය**




හතරවන ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් 47%ක පහසුතාවක් පෙන්වා ඇත. ලකුණු ලබා ගැනීමේ දී,

0 - 3 ප්‍රාන්තරයේ 24 %ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 34% ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 29 %ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 13 %ක් ද,
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ට වඩා ලබාගත් පිරිස 13%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 24%ක් ලකුණු 03 ට අඩුවෙන් ලබාගෙන ඇත.




★මෙම ප්‍රශ්නයට අයත් කොටස් අතුරින් පහසුතාව වැඩිකොටස (ii)වන කොටස වන අතර එහි පහසුතාව 76%කි. එසේම පහසුතාව අඩුම කොටස (i)වන කොටස වන අතර එහි පහසුතාව 23%කි.

★පෙළපොතෙහි සඳහන් මූලික විභක්ති ප්‍රයෝග පිළිබඳ අවබෝධය ලබාදීමට යෝජනා කෙරේ.

★නාමවර නැගීමෙහි මූලික ශබ්ද වරනැගීම පිළිබඳ අවබෝධය හා විභක්තිවල වරනැගෙන විශේෂ රූප කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමට යෝජනා කෙරේ. (උදා; තෘතීයා /චතුර්ථී /සප්තමී)

05. (i) උදාහරණය ආශ්‍රයෙන් සුදුසු පරිදි වගු සම්පූර්ණ කරන්න. *(ලකුණු 02 යි)*
In accordance with the given example, complete the following table. *(02 marks)*

| උදා - eg. लट् | වර්තමාන / present | වචනය / number |
|---|---|---|
| लङ् | अनद्यतनातीते / අතීත කාලය | |
| विधिलिङ् | විධිසම්භාවනයොඃ / විධාන හා සම්භාවනාර්ථ | |


(ii) සුදුසු කෘදන්ත රූපවලින් වගුව සම්පූර්ණ කරන්න. *(ලකුණු 04 යි)*
Complete the following table with appropriate *kṛdantās.* *(04 marks)*

| √ कृ | √ नी | √ लिख् | √ भू |
|---|---|---|---|
| तुमन्त | पूर्वक्रिया | वर्तमानकृदन्त | अतीतकृदन्त |
| कतुर्म् | नीत्वा | लिखत् | भूत |

(iii) පහත සඳහන් වගුව සුදුසු පරිදි සම්පූර්ණ කරන්න. *(ලකුණු 06 යි)*
Complete the following table suitably. *(06 marks)*


| आख्यातपद | लकार | वचन | अर्थ |
|---|---|---|---|
| लिखत। | लोट् | बहुवचन | ලියවු / ලියහුවා |
| करिष्यामः। | लृट् | बहुवचन | කරන්නෙමු |

**05වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා**




පස්වන ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් 30%ක පහසුතාවක් පෙන්වා ඇත. ලකුණු ලබා ගැනීමේ දී,
0 - 3 ප්‍රාන්තරයේ 41 %ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 39%ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 11 %ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 09%ක් ද,
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 වඩා ලබාගත් පිරිස 9%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 41%ක් ලකුණු 3 ට අඩුවෙන් ලබාගෙන ඇත. ආඛ්‍යාත හා කෘදන්ත ඇසුරෙන් මැන බැලෙන නිපුණතාවකි.




⋆මෙම ප්‍රශ්නයෙහි කොටස් තුනකි. 05 (i) කොටස සඳහා පහසුතාව 37%ක් ද, 05(ii) කොටස සඳහා පහසුතාව17%ක් ද, 05 (iii) සඳහා පහසුතාව 36%ක් ද, වේ .

⋆ 1, 4 ,6 ,10 ධාතු ගණ මගින් තැනෙන තුමන්ත පූර්වක්‍රියා වර්තමාන කෘදන්ත අතීත කෘදන්තවලට අදාළ ධාතු 30ක් වත් ප්‍රායෝගික පුහුණු කරවීමට යෝජනා කෙරේ.

⋆ පෙළපොතෙහි සඳහන් ලකාර හා අර්ථ පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමට යෝජනා කෙරේ.

06. (i) दुर्जनः परिहर्तव्यो विद्ययालङ्कृतोऽपि सन्। යන පාඨයෙහි ඇති සමාසපදය කුමක් ද? *(ලකුණු 02 යි)*
What is the *samāsa* word in the phrase दुर्जनः परिहर्तव्यो विद्ययालङ्कृतोऽपि सन्। ? *(02 marks)*

दुर्जनः


(ii) श्रेष्ठ - यदा - विदेशीय - भगवान् මෙම වචන සුදුසු පරිදි වගුගත කරන්න. *(ලකුණු 04 යි)*
Complete the following table with the appropriate derivatives. *(04 marks)*

| अस्त्यर्थतद्धित | अनेकार्थतद्धित | अतिशयार्थतद्धित | अव्ययतद्धित |
|---|---|---|---|
| भगवान् | विदेशीय | श्रेष्ठ | यदा |

(iii) පහත දැක්වෙන සමාසපද ඉදිරියෙන් සමාසනාමය ලියන්න. *(ලකුණු 06 යි)*
Write the name of the *samāsa* against each compound. *(06 marks)*

| | |
|---|---|
| देवलोकः | तत्पुरुष समास |
| नरसिंहः | कर्मधारय समास |
| त्रिरात्रम् | द्विगु समास |
| चक्रपाणिः | बहुव्रीहि समास |
| वृक्षमूलम् | तत्पुरुष समास |
| प्रतिवाचम्। | अव्ययीभाव समास |


**06වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා**




හයවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයන් 31%ක පහසුතාවක් පෙන්වා ඇත. ලකුණු ලබා ගැනීමේ දී,

0 - 3 ප්‍රාන්තරයේ 51 %ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 37 %ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 07 %ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 05 %ක් ද, ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 වඩා ලබාගත් පිරිස 5%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 51%ක් ලකුණු 3ට අඩුවෙන් ලබාගෙන ඇත. සමාස හා තද්ධිත ඇසුරෙන් මැන බැලෙන නිපුණතාවකි.




★මෙම ප්‍රශ්නය කොටස් තුනකින් සමන්විත ය. 06 (i) කොටස සඳහා පහසුතාව 31%ක් ද, 06(ii) කොටස සඳහා පහසුතාව 32%ක් ද, 06(iii) කොටස සඳහා පහසුතාව 28%ක් ද වේ. මෙහි සියලු කොටස් සඳහා 40%කට අඩු පහසුතාවක් පෙන්නුම් කර ඇත.

★ වාක්‍ය ඛණ්ඩයක් තුළ ඇති සමාස පදයක් හඳුනා ගැනීමේ කුසලතාව ප්‍රායෝගික ව පුහුණු කිරීමට යෝජනා කෙරේ.

★ පෙළපොතෙහි සඳහන් සමාස හා තද්ධිත ප්‍රභේදගතව හඳුනා ගැනීමට පුහුණු කිරීමට යෝජනා කෙරේ.

07. (i) වරහන් තුළ ඇති වචන සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවන්න. *(ලකුණු 07 යි)*

Fill in the blanks with the appropriate words given within the brackets. *(07 marks)*

( कथयति - सततम् - विनोदेन - प्रत्यहं - बहुमूल्यं - कोऽपि - कस्मिंश्चिन्नगरे )

आसीत् कस्मिंश्चिन्नगर कथाप्रियो नाम कोऽपि राजा । राज्यकार्य उदासीनोऽसौ विनोदेन कालमनयत् स्तुतिपाठकैः सह सततम् । प्रत्यह नूतनः कश्चित्पुरुषः कथयति नृपतयेऽभिनवां कथाम् । कथाश्रवणेन हृष्टः स भूपश्च तस्मै प्रयच्छति बहुमूल्यं पारितोषिकम् ।

(ii) පහත දැක්වෙන ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. *(ලකුණු 05 යි)*

Answer the questions asked on the following paragraph. *(05 marks)*

कस्मिंश्चिद्देशे सिंहदम्पती प्रतिवसतः स्म । अथ सिंही पुत्रद्वयमजीजनत् । सिंहोऽपि नित्यमेव मृगान्व्यापाद्य सिंह्यै ददाति । अथान्यस्मिन्नहनि तेन किमपि नासादितम् । वने भ्रमतोऽपि तस्य रविरस्तं गतः । अथ तेन स्वगृहमागच्छता श्रृगालशिशुः प्राप्तः । स च बालकोऽयमित्यवधार्य यत्नेन दंष्ट्रामध्यगतं कृत्वा सिंह्यै जीवन्तमेव समर्पितवान् । ततः सिंह्याऽभिहितम् " भोः कान्त ! त्वयानीतं किंचिदस्माकं भोजनम् ? सिंह आह- " प्रिये ! मयाऽद्यैनं शृगालशिशुं परित्यज्य न किंचित्सत्त्वमासादितम् । स च मया " बालोऽयमिति " मत्वा न व्यापादितो विशेषात्स्वजातीयश्च ।

(a) සිංහදෙනුව පැටව් කීදෙනෙක් බිහි කළා ද?

How many cubs did female lion breed?

පුතුන් දෙදෙනෙක් / पुत्रद्वयम्

(b) සිංහයාට සිවල් පැටියා හමුවූයේ කෙසේ ද?

How did the lion meet the jackal cub ?

වනයේ සිට තම නිවසට ආපසු එන විට/ स्वगृहमागच्छता

(c) සිංහයා, සිංහදෙනුවට සිවල්පැටියා දුන්නේ කෙලෙස ද?

How did lion give the jackal cub to female lion?

ජීවිතය තිබිය දීම (නොමරා)/ जीवन्तमेव

(d) සිංහයා විසින් සිංහදෙනුවට කියන ලද්දේ කුමක් ද?

What did lion say to female lion ?


මේ සිවල් පැටියා හැර වෙනත් සතෙක් නොලබන ලදි. මූ පැටියෙකැයි සිතා නොමරන ලද්දේ ය.

(e) ඉරිඇඳි කොටසෙහි අර්ථය ලියන්න.

Write the meaning of the underlined fragment.

පින්වත් ස්වාමියා ඔබ විසින් අපහට කිසියම් ආහාරයක් ගෙනෙන ලද්දේ ද?


## 07 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා




හත්වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් 45%ක් පහසුතාවක් පෙන්වා ඇත. ලකුණු ලබාගැනීමේ දී,
0 - 3 ප්‍රාන්තරයේ 31 %ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 37 %ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 27 %ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 05 %ක් ද,
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 වඩා ලබාගත් පිරිස 5%ක් වන අතර අයදුම්කරුවන්ගෙන් 31%ක් ලකුණු 3ට අඩුවෙන් ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය නිර්දිෂ්ට ගද්‍ය පාඨ ඇසුරින් සැකසෙන වරණීය ප්‍රශ්නයකි. ශිෂ්‍යයාගේ අවබෝධාත්මක නිපුණතාව මැන බැලෙන්නෙකි.




★මෙහි කොටස් දෙකකි. 07(i) කොටසින් නිර්දිෂ්ට ගද්‍ය පාඨයක වාක්‍ය රටා පිළිබඳ අවබෝධය මැන බැලීම සිදු කෙරේ. එහි පහසුතාව 40%කි. 07(ii) කොටසින් නිර්දිෂ්ට ගද්‍ය පාඨ ඇසුරින් කෙටි ලිඛිත ප්‍රශ්න 05ක් විමසා බලා ඇත. එහි දී 07 (ii) (a) 84%ක් ද, 07 (ii) (b) 41%ක් ද, 07 (ii) (c) 38%ක් ද, 07 (ii) (d) 34% ක් ද, 07 (ii) (e) 33%ක ද පහසුතාවක් පෙන්නුම් කරයි.

★නිර්දිෂ්ට ගද්‍ය පාඨ ඇසුරින් ප්‍රශ්න පත්‍ර ආකෘතියට අනුරූප ආකෘති සකසා සිසුන් ප්‍රායෝගික පුහුණුව සඳහා යොමු කිරීමට යෝජනා කෙරේ.

08. (i) පහත දැක්වෙන වාක්‍ය සිංහලයට පරිවර්තනය කරන්න. *(ලකුණු 04යි)*

Translate the following sentences into English. *(04 marks)*

१. नास्ति तृष्णा समं तोयं । තෘෂ්ණාව හා සමාන සැඩ පහරක් නොමැත.

१. कदा त्वं तत्र गच्छसि । ඔබ එහෙ යන්නේ කීයට ද?

१. अत्र केवलं मा तिष्ठ । තනිය ම මෙහෙ ඉන්න එපා.

१. तथैवास्तु भवान् । ඔබට එසේ ම වේවා ?

(ii) පහත දැක්වෙන වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරන්න. *(ලකුණු 04 යි)*

Translate the following sentences into Sanskrit. *(04 marks)*

(a) උදේ 5.00 ට පාඩම් කරමු.

Let us study at 5.00 a.m. in the morning.

प्रातः पञ्चवादने पठामः ।

(b) අම්මත් එක්ක එහෙ යන්න.

Go there with mother.

मात्रा सह तत्र गच्छ ।

(c) සුබ උදෑසනක්, හැමෝ ම හොඳින් ද?

Good morning. Are all okay?

सुप्रभातम् । अपि सर्वं कुशलम् ।

(d) ඇය හැමදාම බසයෙන් පාසල් යයි.

She goes to school by bus every day.

सा सदैव लोकयानेन विद्यालयं गच्छति ।


(iii) චිත්‍රය ඇසුරෙන් වචන තුනකට නොඅඩු සංස්කෘත වාක්‍ය 04ක් දේවනාගරී අකුරෙන් ලියන්න. (එක ම වචනය දෙවරකට වඩා භාවිත නොකළ යුතු ය.) *(ලකුණු 04 යි)*

Write **four** sentences each consisting of not less than three words, on the following picture. Use Devanāgarī characters. (The same word should not be used more than twice). *(04 marks)*



## 08වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා


**ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය**




අටවන ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් එම ප්‍රශ්නය සඳහා 29 ක පහසුතාවක් පෙන්වා ඇත. ලකුණු ලබා ගැනීමේ දී,

0 - 3 ප්‍රාන්තරයේ 25 %ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 44 %ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 29 %ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 02 %ක් ද, ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10 ට වඩා ලබාගත් පිරිස 2%ක තරම් ඉතා පහළ අගයක් ගනී. ලකුණු 3ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 25% කි.




★ මෙම ප්‍රශ්නයට අයත් කොටස් හා අනුකොටස් අතුරෙන් පහසුතාව වැඩිම අනුකොටස (ii) (b) වන අතර එහි පහසුතාව 40%කි. අඩුම පහසුතාවක් පෙන්නුම් කර ඇත්තේ (ii) (c) වන අතර එහි පහසුතාව 20%කි.

★ භාෂාව පිළිබඳ අපේක්ෂකයන් තුළ ඇති නිර්මාණශීලීත්වය මැන බැලෙන නිපුණතාවකි. අපේක්ෂයින් විසින් මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ පහළ අගයක් පෙන්නුම් කිරීමට හේතු වී ඇත්තේ ලබාගන්නා ලකුණු හා පිළිතුර සංසන්දනය කිරීම විය හැකිය. අනුකොටස් 3හි වාක්‍ය 12ක් නිර්මාණය කිරීමෙන් සම්පූර්ණ ලකුණු ලැබිය යුතු ය. එහෙත් අපේක්ෂකයා ඊට මැලිබවක් දක්වන බව නිරීක්ෂණ වේ. මෙම ප්‍රශ්නයෙහි ආකෘතිය දෙස පමණක් බලා අපේක්ෂකයා ප්‍රශ්නය තෝරා ගැනීමට නොපෙළඹේ. නගර අක්ෂර ලිවීමේ මැලිකම ද අනවබෝධය ද මේ සඳහා විශේෂ බලපෑමක් ඇති කොට ඇත.

★ සංස්කෘත භාෂාවෙන් මාතෘභාෂාවට සහ මාතෘභාෂාවෙන් සංස්කෘත භාෂාවට සරල වාක්‍ය පුහුණු කිරීමට ශිෂ්‍යයන් යොමු කිරීමට යෝජනා කෙරේ.

## III කොටස

## 3 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

### 3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

- ⋆අමතර ව කියවීම් කාලය සඳහා ලබාදෙන විනාඩි 10ක කාලය ප්‍රශ්නපත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව ලබා දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් පමණක් යොදා ගත යුතුය. (එම කාලය පිළිතුරු ලිවීමට යොදා නොගන්න.)
- ⋆ I පත්‍රයට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන පැහැදිලි එක් කතිර ලකුණක් (X) පමණක් යෙදිය යුතුය.
- ⋆ ප්‍රශ්න සඳහා නියමිත කාලය කළමනාකරණය කර ගත යුතු ය.
- ⋆ II පත්‍රයට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.
- ⋆ පිළිතුරු ලිවීම සඳහා ලබා දී ඇති ඉඩ ප්‍රමාණය පමණක් නිසි ලෙස භාවිතයට ගත යුතු ය.
- ⋆ ප්‍රශ්න පත්‍රයෙහි ලබා දී ඇති උපදෙස් නිසි ලෙස පිළිපැදිය යුතු ය.
- ⋆ අනිවාර්යෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්යෙන් කළ යුතු ය.
- ⋆ උත්තර පත්‍ර ලිවීමේ දී නිල් කාබන් පෑනක් පමණක් භාවිත කිරීම වඩා සුදුසු ය.
- ⋆ නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.
- ⋆ භාෂාවට ආවේණික පාරිභාෂික ශබ්ද පමණක් භාවිත කළ යුතු ය. උදා-:(ප්‍රථමා විභක්තිය/ කර්මධාරය/ ද්විගු)
- ⋆ විභාග අංකය සඳහන් කළ සෑම ස්ථානයක ම පැහැදිලි ව හා නිවැරදි ව සටහන් කළ යුතු ය.
- ⋆ ලියන ලද පිළිතුර ඉවත් කිරීමට අවශ්‍ය වූ විට තනි ඉරකින් කපා දමා තම අත්සන යෙදීම කළ යුතු ය.
- ⋆ පිළිතුරුපත් ඇමිණීමේ දී පිටු අංක පිළිවෙලට ඇමිණිය යුතුය.

## 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා

01. අක්ෂර මාලාවේ ප්‍රධාන ප්‍රභේද හා අදාළ අක්ෂර ලිවීම, කියවීම හා නිවැරදි පිළි භාවිතය ආදිය හඳුනාගැනීමේ පුහුණුව ලබාදිය යුතු ය. එසේම ඒ ඒ අක්ෂර ප්‍රභේදයන්ට අදාළ අක්ෂර සංඛ්‍යාව පිළිබඳ ව ද අවබෝධය ඇති කිරීමට කටයුතු කළ යුතු ය.

02. සංයුක්තාක්ෂර ලිවීමේ හා කියවීමේ ශක්‍යතාව සංවර්ධනය කළ යුතුය.

03. සන්ධි වර්ගීකරණයන්ට අදාළ මූලික අවබෝධය පාඨ ග්‍රන්ථ ආශ්‍රයෙන් හා ප්‍රායෝගික භාෂා ව්‍යවහාරය තුළින් ලබාදීමට කටයුතු කළ යුතු ය.

04. සමාස හා තද්ධිත පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් අපේක්ෂා කරන අතර (බුද්ධ ධර්මය, ධර්ම ශාලාව, ලඞ්කාද්වීපය, දේශීය, විදේශීය, රාජකීය) වැනි ප්‍රායෝගික උදාහරණ ඔස්සේ ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කළ යුතු ය.

05. නාම වරනැඟීම ඒකකයට අදාළ ව නාමයන් ලිඞ්ගභේදයට අනුව වර්ගීකරණය වන ආකාරය පිළිබඳ අවබෝධය ඇති කළ යුතු ය.

06. ඒ ඒ විභක්ති හා ඒවායෙහි අර්ථයන් පිළිබඳ පුහුණුව තවදුරටත් සංවර්ධනය කළ යුතු ය.

07.කෘදන්ත පිළිබඳ සිද්ධාන්තමය දැනුමට අමතරව ප්‍රායෝගික භාවිතය පිළිබඳ පුහුණුව ඇති කළ යුතු ය.

08. සියලු ම ව්‍යාකරණ, සිද්ධාන්තවලට අදාළ උදාහරණ හා භාවිතයන් නිර්දිෂ්ටපාඨ ග්‍රන්ථ මගින් ඉගැන්වීමට ප්‍රමුඛතාව ලබාදිය යුතු ය.

09. නිර්දිෂ්ට ගද්‍ය හා පද්‍ය පාඨයන් හි අර්ථය වාචෝද්ගත කිරීමට අමතරව වාක්‍ය ඛණ්ඩ වශයෙන් පරිවර්තනය කිරීමේ ශක්‍යතාව ඇතිකළ යුතු ය.

10. පෙළපොතෙහි භාවිත මාතෘකා පාඨ හා විශේෂ උද්ධෘත පරිවර්තනයට හා විචාරයට ලක් කිරීමට පුහුණුව ලබා දිය යුතු ය.

11. නිර්දිෂ්ට ග්‍රන්ථයන් හි කථා පුවත් මාතෘභාෂාවෙන් ලිවීමට හා සිතුවමට නැඟීමට නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම ආදි ක්‍රමවේද ඔස්සේ ඉගැන්විය යුතු ය.

12. සාරස්වතයෙහි මූලික සූත්‍ර වාචෝද්ගත කරවීම හා ඒවායෙහි අර්ථය පුහුණු කරවිය යුතු ය.

13. කාල තුනට අදාළ ව සරල වාක්‍යය මාතෘභාෂාවෙන් සංස්කෘතයට ද සංස්කෘතයෙන් මාතෘභාෂාවට ද පරිවර්තනය කිරීමේ ශක්‍යතාව සංවර්ධනය කළ යුතු ය.

14. සංස්කෘත භාෂාවෙන් සරල ගද්‍ය නිර්මාණයක් කිරීමේ හැකියාව ඇති කළ යුතු ය.

15. ප්‍රශ්න පත්‍ර ආකෘතියට අදාළ ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ පුහුණුව ලබා දිය යුතු ය.